රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 32/96

මගේ අංකය :- ආ/IV/2/1/25
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996 නොවැම්බර් මස 12 දින

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**රාජ්‍ය නිලධාරීන් විශ්‍රාම ගැන්වීම - විශ්‍රාම ගැනීම් පිළිබඳ මනාපය**

1996.12.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අවලංගු කරනු ලැබේ.

I. 1990.10.18 දිනැති රා.පරි.චක්‍රලේඛ අංක 44/90
II. 1990.10.20 දිනැති රා.පරි.චක්‍රලේඛ අංක 44/90 (I)
III. 1990.12.24 දිනැති රා.පරි.චක්‍රලේඛ අංක 44/90 (II)
IV. 1991.03.14 දිනැති රා.පරි.චක්‍රලේඛ අංක 44/90(III)

02. රාජ්‍ය පරිපලාන චක්‍රලේඛ 44/90 යටතේ 1996.12.16 දින හෝ එයට පෙර විශ්‍රාම යාමට අදහස් කරන නිලධාරියකු විශ්‍රාම ගැනීම සඳහා වූ මසක කල්දීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

03. 1996.12.17 දින සිට ක්‍රියාත්මක වන සියළුම විශ්‍රාම ගැනීම් කලින් කල සංශෝධිත 1934 පෙබරවාරි මස 05 දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව සිදු කෙරෙනු ඇත.

04. එසේ වුවද 1988.08.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/88 මගින් පැනවූ වසර විස්සක සේවයෙන් පසු විශ්‍රාම ගැනීමේ මනාපය පළකිරීමේ අයිතිය තවදුරටත් වලංගුව පවතී. එම චක්‍රලේඛයේ ඉඩ සලසා ඇති පරිදි, එවැනි නිලධාරියෙකුට විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ අයිතිය ලැබෙන්නේ වයස අවුරුදු 55 සම්පූර්ණ වූ පසුවය.

05. මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු ඔබ ආයතනය යටතට ගැනෙන සියළුම නිලධාරීන්ගේ අවධානයට යොමු කළ යුතුය.

06. මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.